# POLITICAL SCIENCE AND ITS SUB FIELDS (Part V)

# තුළනාත්මක දේශපාලනය

# (Comparative Politics)

1950 දශකයෙන් පසු දේශපාලන විද්‍යාවේ නිෂ්චිත ධාරාවක් ලෙස තුළනාත්මක දේශපාලනයේ වර්ධනය සිදු විය. එය ඇමෙරිකානු දේශපාලන විද්‍යාව තුළ ආරම්භ වී, පසු ව දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ 'අධ්‍යයන ධාරාවක්' සහ 'අධ්‍යයන විධි ක්‍රමයක්' ලෙස ද ව්‍යාප්ත විය.

තුළනාත්මක දේශපාලනය හැදෑරීමේ ඉතිහාසය ඇරිස්ටෝටල්ගෙන් ආරම්භ වන අතර වඩාත් සුදුසු ආණ්ඩු ක්‍රමයක් යෝජනා කිරීම සඳහා එකල ග්‍රීසියේ පැවති පෞර රාජ්‍යයන් ගණනාවක් ම එය අධ්‍යයනය කළේ ය.

මැකියාවෙල්ලිද තම දේශපාලන අධ්‍යයනය සඳහා තුලනාත්මක ප්‍රවේශයක් භාවිත කෙළේය.

දේශපාලන විද්‍යාවේ සාම්ප්‍රදායික අවධානය යොමු වී තිබුණු යුරෝපයෙන් සහ ඇමෙරිකාවෙන් පිටත, ලෝකයේ වෙනත් රටවල දේශපාලන ක්‍රම ගැන අධ්‍යයනයට දේශපාලනඥයන් උනන්දු වීම, තුළනාත්මක දේශපාලනය අධ්‍යයන ධාරාවක් ලෙස වර්ධනය වීමට හේතු විය.

ClassWork.LK

ඒ අනුව තුන්වැනි ලෝකයේත්, රුසියාව ප්‍රමුඛ සමාජවාදී රටවලත්, දේශපාලනයේ සහ දේශපාලන ක්‍රමයේ ඇති විශේෂතා හඳුනා ගැනීමට දේශපාලන විද්‍යාඥයෝ ඉදිරිපත් වූහ.

මෙයින් සිදුවූයේ දේශපාලන විද්‍යා විෂයයේ තිබූ ඇමෙරිකානු සහ යුරෝපීය කේන්ද්‍රීය අවධානය වෙනස් වීම යි.

මෙසේ එක් එක් රටවල දේශපාලනය තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මඟින්, දේශපාලන ක්‍රියාවලි ගැන පොදුවේ අදාළ වන සාමාන්‍යකරණ නිගමනවලට එළඹීමට දේශපාලනඥයන් පෙලැඹීම හේතු කොටගෙන, එය විධි ක්‍රමයක් බවට පත් විය.

උදා :-

මැතිවරණ ක්‍රම, ඡන්ද දායකයන්ගේ චර්යාවට බලපාන ආකාරය රටවල් කිහිපයක් ඇසුරින් අධ්‍යයනය කර, පොදු නිගමනවලට (සාමාන්‍යකරණීය කරන ලද) එළඹීමේ හැකියාව ලැබේ. මෙම විධික්‍රමය තුළනාත්මක විධි ක්‍රමය යැයි හඳුන්වනු ලැබේ.

Class Work.LK

## තුළනාත්මක දේශපාලන හා ආණ්ඩුක්‍රම හැදෑරීමට දේශපාලන විද්‍යාඥයන් උනන්දු වන්නේ කුමක් නිසා ද?

දේශපාලනය වෙනත් රටවල් සමඟ තුලනාත්මක ව හැදෑරීමෙන් අපට අපේ රටේ දේශපාලනය ගැන වඩාත් හොඳ අවබෝධයක් ලබා ගත හැකි වීම.

අනෙකුත් රටවල දේශපාලනය ගැන මනා අවබෝධයකට, අප ඒ එක් එක් රටක් ගැන පමණක් නොව, රටවල් කිහිපයක් සසඳා බැලීම ද බෙහෙවින් ප්‍රයෝජනවත්ය.

නූතන දේශපාලන විද්‍යා විග්‍රහයේ එක් කාර්යයක් වන්නේ දේශපාලන ගැටලු සහ තේමා පිළිබඳ සාමාන්‍යකරණය කරන ලද පොදු නිගමනවලට එළඹීමයි.

ClassWork.LK

## තුළනාත්මකව අධ්‍යයනය කරන්නේ මොනවා ද?

දේශපාලන විද්‍යාඥයෝ රටවල් අතර සැසඳීම කරති.

උදා:-

දේශපාලන පක්ෂ ක්‍රමය ගැන රටවල් කිහිපයක තුළනාත්මක අධ්‍යයනයක් කළ හැකි ය. (Cross-National Comparisons)

රටක් ඇතුළත ද තේමාත්මක සැසඳීම් කළ හැකි ය.

උදා:-

ස්ත්‍රී-පුරුෂ මැතිවරණ සහභාගිත්වයේ ප්‍රවණතා, පිළිබඳ ව ග්‍රාමීය සහ නාගරික වශයෙන් තුළනාත්මක අධ්‍යයනයක් කළ හැකි ය. (Within-Country Comparisons)

Class Work.LK

දේශපාලන විද්‍යාත්මක වශයෙන් වැදගත් තේමා අන්තර්ජාතික වශයෙන් තුළනාත්මකව අධ්‍යයනය කළ හැකි ය.

උදාː-

ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය, ජනාධිපති ආණ්ඩුක්‍රමවල සාර්ථක-අසාර්ථක භාවය.

සමානුපාතික නියෝජන ක්‍රමය, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට කරන බලපෑම.

ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වයේ ප්‍රවණතා ආදිය තුළනාත්මක ව අධ්‍යයනය කළ හැකි තේමා වේ.

ClassWork LK

# අභ්‍යාස

1. දේශපාලන විද්‍යාව සමන්විත වන උපවිෂය ක්ෂේත්‍ර හොඳින් අධ්‍යයනය කර බිත්ති පුවත්පතක් හෝ සඟරාවක් හෝ සකස් කරන්න.

ClassWork.LK

ClassWork.LK